

කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
සමාජීය විද්‍යා අධ්‍යයන මණ්ඩලය

# 2024

# ශාස්ත්‍රපති උපාධි පාඨමාලා (MA)
# සමාජීය විද්‍යාපති උපාධි පාඨමාලා (MSSc)

## පශ්චාද් උපාධි පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවීම

**විෂයයන්** (පාඨමාලා සම්බන්ධව වැඩිදුර විස්තර සඳහා)

- පුරාවිද්‍යාව (011-2903891)
- ආර්ථික විද්‍යාව (011-2903827)
- භූගෝල විද්‍යාව (011-2903920)
- ඉතිහාසය (011-2903841)
- පුස්තකාල හා විඥාපන විද්‍යාව (011-2903901)
- ජනසන්නිවේදනය (011-2903862)
- දර්ශනය (011-2903871)
- දේශපාලන විද්‍යාව (011-2903833)
- සමාජ විද්‍යාව (011-2903939)

| පාඨමාලා ගාස්තු | අවසාන දිනය | මාධ්‍යය |
|---|---|---|
| ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (MA) – Rs. 200,000/-<br>සමාජීය විද්‍යාපති උපාධි පාඨමාලාව (MSSc) – Rs. 230,000/-<br>* පාඨමාලා ගාස්තුව වාරික හතරකින් (04) ගෙවිය හැක | 2024 නොවැම්බර් 29 | සිංහල / ඉංග්‍රීසි<br>* සමාජ විද්‍යාව සහ ආර්ථික විද්‍යාව පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද පවත්වනු ලැබේ. |

## සුදුසුකම්

- **ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (MA එක් අවුරුදු)**
  පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සහිතව ලබාගත් ශාස්ත්‍රවේදී (විශේෂ හෝ සාමාන්‍ය) උපාධිය හෝ කැලණිය විශ්වවිද්‍යාලයීය සනාතන සභාව විසින් පිළිගනු ලබන ඊට සමාන අධ්‍යාපන හෝ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම.

- **සමාජීය විද්‍යාපති උපාධි පාඨමාලාව (MSSc – දැවුරුදු)**
  පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සඳහා පන්ති සාමාර්ථයක් සහිතව ලබාගත් ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය හෝ කැලණිය විශ්වවිද්‍යාලයීය සනාතන සභාව විසින් පිළිගනු ලබන ඊට සමාන අධ්‍යාපන හෝ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම.

  **පුස්තකාල හා විඥාපන විද්‍යාව සමාජීය විද්‍යාපති උපාධි පාඨමාලාව සඳහා පමණක් :**
  පිළිගත් විශ්වවිද්‍යාලයකින් පන්ති සාමර්ථ්‍යයක් සහිතව ලබාගත් (විශේෂ/සාමාන්‍ය) උපාධියක් සහ පිළිගත් පුස්තකාලයක මාණ්ඩලික තත්ත්වයේ එක් වසරක පළපුරුද්ද හෝ පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් (විශේෂ හෝ සාමාන්‍ය) උපාධියක් සහ කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව උසස් ඩිප්ලෝමාව හෝ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අවසන් පරීක්ෂණය සමත්ව තිබීම.

## අයදුම් කරන ආකාරය

අයදුම් පත්‍ර ගාස්තුව රු. 1000ක් වන අතර එය මහජන බැංකුවේ අංක 055-1001-8066 9229 දරණ ගිණුමට මුදල් මගින් හෝ ණය පත් (credit cards) මගින් ගෙවිය හැක.

**https://fgs.kln.ac.lk** වෙබ් අඩවිය මගින් මාර්ගගතව අයදුම් කළ යුතුය. එම අයදුම්පතෙහි මුද්‍රිත පිටපතක් අයදුම්කරු විසින් අත්සන් කර මෙහි සඳහන් ලේඛන සමඟ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම සිදුකළ යුතුය.

නියෝජ්‍ය ලේඛකාධිකාරී, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

## අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ලේඛන

1. සහතික කළ උපාධි සහතිකයේ සහ විස්තරාත්මක ප්‍රතිඵල ලේඛනයේ පිටපත්
2. සහතික කළ වෘත්තීය සුදුසුකම් සහතිකවල පිටපත්
3. උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක්
4. ජාතික හැඳුනුම්පතේ / විදේශ ගමන් බලපත්‍රයේ / රියැදුරු බලපත්‍රයේ සහතික කළ පිටපතක්
5. අයදුම් පත්‍ර ගාස්තුව ගෙවූ බැංකු රිසිට්පත

අයදුම්පත් බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ, ...විෂයය... ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පාඨමාලා අයදුම්පත 2024, යනුවෙන් සඳහන් කළ යුතුය.

ලේඛකාධිකාරී,
කැලණිය විශ්වවිද්‍යාලය.
2024. 10. 29

**සාමාන්‍ය තොරතුරු හා තාක්ෂණික සහාය සඳහා**

**අමතන්න : 011 290 3952/3 | ඊ - තැපෑල : fgs@kln.ac.lk | වෙබ් - https://fgs.kln.ac.lk**

tamilguru.lk